සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

**විද්‍යාව**
**Science**

**කාලය පැය 02 යි**
**02 Hour**

නම / විභාග අංකය:
Name/ Index No:

## I - කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරි අඳින්න.

(1) පියවි ඇසට පැහැදිලිව නොපෙනෙන ඉතා කුඩා දේ පැහැදිලිව දැක ගැනීමට භාවිත කළ හැකි උපකරණයකි.
1. දුරේක්ෂය 2. සංයුක්ත අන්වීක්ෂය 3. අත් කාචය 4. ප්‍රිස්ම දෙනෙතිය

(2) වර්ධනය වන දේ පමණක් අඩංගු වරණය වන්නේ.
1. ගොළුබෙල්ලා, මිරිස් පැලය, ගැඩවිලා
2. මුවා, පොල් ගස, උදැල්ල
3. මේසය, කතුර, පූසා
4. කොස් ගස, අලියා, යතුරු පැදිය

(3) ස්වයං පෝෂී ජීවියකු වන්නේ,
1. මිනිසා 2. සමනලයා 3. ගවයා 4. අඹ ගස

(4) ශාක තුළ ආහාර නිෂ්පාදනය කරන ක්‍රියාවලිය හඳුන්වන්නේ,
1. ශ්වසනය ලෙස ය. 2. වර්ධනය ලෙස ය. 3. සංචරණය ලෙස ය. 4.ප්‍රභාසංශ්ලේෂණය ලෙස ය.

(5) ශ්වසන චලන පැහැදිළිව නිරීක්ෂණය කළ හැකි සතෙකි.
1. බල්ලා 2. ගැඩවිලා 3. මදුරුවා 4. ඉබ්බා

(6) 'මුහුදු මල' අයත් වන ජීවී කාණ්ඩය වන්නේ,
1. ශාක 2. සතුන් 3. ක්ෂුද්‍ර ජීවීන් 4. ඇල්ගී

(7) පෝච්චියක සිටවූ ශාකයක්, නිවස තුළ විවෘත ජනේලයක් අසල තබා ඇත. දින කිහිපයකින් එම ශාකය,
1. ජනේලය දෙසට හැරී වැඩේ.
2. ජනේලයෙන් ඉවතට හැරී වැඩේ.
3. ජනේලය දෙසට හෝ ඉන් ඉවතට නොනැමේ.
4. ශාකයේ වර්ධනය නවතී.



(8) නොවිකා ගිලින සතෙක් වන්නේ,
1. රිලවා 2. ගවයා 3. ගිරවා 4. හාවා

(9) ප්‍රභාසංශ්ලේෂණයේදී භාවිතයට ගැනෙන වායුවක් වන්නේ,
1. ඔක්සිජන් 2. නයිට්‍රජන් 3. වාතය 4. කාබන්ඩයොක්සයිඩ්

(10) විෂම පෝෂී ජීවියෙකු ලෙස සැලකිය නොහැක්කේ.
1. බැක්ටීරියා 2. දිලීර 3. පොල් ගස 4. පූසා


(11) ස්කන්ධය මැනීමට යොදාගන්නා අන්තර් ජාතික ඒකකය වන්නේ,
1. කිලෝග්‍රෑම් 2. මීටර 3. තත්පර 4. සෙල්සියස් අංශක

(12) ශක්ති විශේෂ පමණක් අඩංගු වරණය දැක්වෙන්නේ.

1. ආලෝකය, තාපය, විදුලිය  2. ජලය, තාපය, වාතය  3. වීදුරු, විදුලිය, ආලෝකය  4. රබර්, කඩදාසි, වීදුරු

(13) නිශ්චිත හැඩයක් නැතත්, නිශ්චිත පරිමාවක් ඇති ද්‍රව්‍ය හඳුන්වන්නේ කුමන නමකින් ද?

1. ඝන  2. ද්‍රව  3. වායු  4. පදාර්ථ


(14) 


කුඩා බෝතලයක් ජලය තුළ ගිල්වා පසුව ඇල කිරීම සිදුකෙරේ. මෙම ක්‍රියාකාරකමෙන් තහවුරු කළ හැක්කේ,

1. වාතය අවකාශයේ ඉඩක් ගන්නා බව.
2. ජලය අවකාශයේ ඉඩක් ගන්නා බව
3. බෝතලයකට ජලය පිරවිය හැකි ආකාරය
4. ජලය තුළ වායු බුබුළු පවතින අකාරය

(15) මිනුම් සරාවෙහි අඩංගු ජල පරිමාව,

1. 44ml කි.
2. 45ml කි.
3. 46ml කි.
4. 47ml කි.





(16) ශාකයකට ජලය වැදගත් වන අවස්ථාවක් ලෙස සැලකිය නොහැක්කේ,

1. ඛනිජ ලවණ අවශෝෂණය  2. ප්‍රභාසංශ්ලේෂණය
3. ආහාර ජීර්ණය  4. ශාක දේහය සිසිලනය

(17) ''හිම'' යනු,

1. ජලයේ ඝන අවස්ථාවයි.  2. ජලයේ ද්‍රව අවස්ථාවයි.
3. ජලයේ වායු අවස්ථාවයි.  4. මතුපිට ජලය සඳහා උදාහරණයකි.

(18) 



ජලය 100***ml*** (100***g***)  ජලය 100***ml*** (101***g***)  ජලය 100***ml*** (105***g***)

මුහුදෙන්, කලපුවකින් හා ළිඳකින් ලබා ගත් සමාන ජල පරිමාවල ස්කන්ධය මැන A, B හා C යන බීකරවල දමා ඇත. (පිළිවෙලින් නොවේ.) මුහුදු ජලය අඩංගුවන බීකරය වන්නේ,

1. A ය  2. B ය  3. C ය  4. B හෝ C ය

(19) පෘථිවි පෘෂ්ඨයේ ජලය මගින් ආවරණය වී ඇති ප්‍රදේශය,

1. 70%කි.  2. 30% කි.  3. 0.01% කි.  4. 97.4% කි.

(20) 


A බඳුනට ගත් ජලය B බඳුනටත්, අනතුරුව B බඳුනෙන් C බඳුනටත් මාරු කිරීම මගින් තහවුරු කළ හැක්කේ,

1. ද්‍රවයකට නිශ්චිත ස්කන්ධයක් ඇති බව.  2. ද්‍රවයකට නිශ්චිත හැඩයක් නොමැති බව.
3. ද්‍රව අවකාශයේ ඉඩක් ගන්නා බව  4. ජලයෙහි විවිධ භෞතික අවස්ථා ඇත

## II - කොටස

---

**උපදෙස්:**

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් සහ අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 ලබා දෙනු ලැබේ.**

---

01. A. පරිසරය යනු අප ඇතුළු වටපිටාව යි. පරිසරයේ අන්තර් ගත දෑ පිළිබඳව සොයා බැලීමට සිදුකල ක්ෂේත්‍ර චාරිකාව ඇසුරින් පිළිතුරු ලියන්න.

i. ක්ෂේත්‍ර චාරිකාවේදී ඔබට පහත නිර්ණායක යටතේ ලැබුණු උපදෙස් එක බැගින් ලියන්න. (ලකුණු 03)

| නිර්ණායකය | ලැබුණු උපදෙස් |
|---|---|
| (a). ඔබගේ ආරක්ෂාව | ..... |
| (b). නිදර්ශක එකතුකර ගැනීම | ..... |
| (c). හමුවන සතුන් නිරීක්ෂණය | ..... |

ii. ක්ෂේත්‍ර චාරිකාවේදී හමුවූ දෑ කිහිපයක් පහත දක්වේ. ඒවා ජීවී ද්‍රව්‍ය, අජීවී ද්‍රව්‍ය ලෙස වෙන් කරන්න. (ලකුණු 02)

(ගොළුබෙලි කවචයක්, ප්‍රරෝහනය වූ කජු බීජයක්, බිම වැටී තිබූ කුරුළු පිහාටුවක්, වලි කුකුලෙක්)

(a). ජීවීන් : .....

(b). අජීවී : .....

iii. ක්ෂේත්‍ර චාරිකාවේදී රැගෙන යන උපකරණ කිහිපයක් පහත දැක්වේ. ඒවායින් ලබාගන්නා ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ලකුණු 04)

| උපකරණය | ප්‍රයෝජනය |
|---|---|
| (a). අත්කාචය | |
| (b). නිදර්ශක බඳුන | |
| (c). ප්‍රිස්ම දෙනෙතිය | |
| (d). උෂ්ණත්ව මානය | |


iv. ඔබගේ නිරීක්ෂණවලදී හඳුනාගත් පහත ලක්ෂණ දරණ ජීවයෙකු බැගින් ලියන්න. (ලකුණු 03)

(a). ස්පර්ෂ කල විට පත්‍ර හැකිලේ .....

(b). ජීවන චක්‍රයේ යම් අවධියක ජලයේ ජීවත්වෙමින් ඉස්ගෙඩියා අවස්ථාව ගත කරයි. .....

(c). සිටින පරිසරයේ වර්ණ අනුව තම ශරීර වර්ණය වෙනස් කර ගනී. .....

B. කිසියම් ජීවී කාණ්ඩයක් පිළිබඳව අධ්‍යයනයක් කිරීමට සිදුකරන ලද ක්‍රියාකාරකමක ඇටවුම් රූප සටහන පහත දැක්වේ. ක්‍රියාකාරකම සිදුකිරීමට ගත් ක්‍රියාමාර්ග ද පහත දැක්වේ.




- බර්මාන් පුනීලය මත ඇති ඇළුමිනියම් පත්‍ර ගොටුව තුලට ''X'' ද්‍රව්‍යය දැමීම.
- බල්බය දැල්වීම
- ''X'' ද්‍රව්‍යයට ජලය මදක් දමා තෙත් කිරීම.
- බර්මාන් පුනීලය හරහා බීකරයට වැස්සෙන ජලය බිංදුවක් ගෙන වීදුරු කදාවක් මත නැංවීම.
- සුදුසු උපකරනයක් මගින් එය නිරීක්ෂණය කිරීම.


(i). ක්‍රියාකාරකම සඳහා ''X'' ලෙස යොදාගන්නේ මොනවාද? (ලකුණු 01)

(ii). බීකරයට වැස්සෙන ජල බිංදුවක් නිරීක්ෂණයට යොදාගන්නා උපකරණය කුමක්ද? (ලකුණු 01)

(iii). ඉහත 2 හි යොදාගත් උපකරණය මගින් ලබාගත් නිරීක්ෂණය හා නිගමනය ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු - 16)

02. A. ජීවීන් තුළ දක්නට ඇති එක්තරා ලක්ෂණයක් නිරීක්ෂණය සඳහා සිදුකරන ක්‍රියාකාරකමක ඇටවුම් රූපයක් පහත දැක්වේ.




i. මෙම ඇටවුම හඳුන්වන නම කුමක්ද? (ලකුණු 01)

ii. මෙම ක්‍රියාකාරකමෙන් ඔබට ලැබෙන නිරීක්ෂණය හා නිගමනය පැහැදිළිව වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

iii. මෙම ක්‍රියාකාරකමෙන් හඳුනාගත් ජීවීන්ගේ ලක්ෂණය හැර ජීවීන් පෙන්වන වෙනත් ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02)

B. පහත දැක්වෙන පැහැදිළි කිරීම්වලින් ප්‍රකාශ වන ජීවීන් සතු ලක්ෂණ හඳුනාගෙන ලියන්න.

i. ජීවියෙක් සමස්ත ශරීරයම පිහිටීම වෙනස් කරගැනීම.

ii. ජීවියෙකුගේ දේහය ප්‍රමාණයෙන් විශාල වීම.


iii. ජීවීන් තම වර්ගයා බෝ කිරීම. (ලකුණු 03)

C. i. සතුන් තුළ දක්නට නොලැබෙන නමුත් ශාකවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. භෝජන විලාසය අනුව කපුටා අයත් වන්නේ කවර කාණ්ඩයට ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

03. A. පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලය පවතින ආකාර පිළිබඳ වට ප්‍රස්ථාරයක් පහත දැක්වේ.




i. X හා Y ප්‍රදේශවලින් නිරූපණය වන ආකාර දෙක පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

ii. නිවසේ දී ජලය අපතේ යන අවස්ථාවක් ලියා එය අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් ද සඳහන් කරන්න. (ලකුණු 02)


iii. මතුපිට ජලයට එකතුවන විෂ රසායනික භූගත ජලයට එකතු වීමෙන් හටගත හැකි රෝග දෙකක් ලියන්න. (ලකුණු 02)

B. i. බාහිර පරිසරයේ ඇති ශබ්ද, ස්වභාවික ශබ්ද හා කෘත්‍රිම ශබ්ද ලෙස වර්ග කළ හැකිය. පහත වගුව පිටපත් කරගෙන ඔබ නිරීක්ෂණය කළ ස්වභාවික හා කෘත්‍රිම ශබ්ද දෙක බැගින් ලියන්න.

| | කෘතීම ශබ්ද | ස්වභාවික ශබ්ද |
|---|---|---|
| (a). | | |
| (b). | | |

(ලකුණු 02)

ii. ශබ්දය නිපදවීම සඳහා සකස් කළ සංගීත භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.





(a). ශබ්දය උපදවන ක්‍රමය සමාන සංගීත භාණ්ඩ දෙක කුමක්ද? (ලකුණු 02)

(b). ශබ්දය පරිහරණය කිරීමේදී අපගේ යුතුකම මෙන්ම වගකීම විය යුත්තේ කුමක්ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

04. A. අදීප්ත වස්තුවක් පෙනීම සඳහා දීප්ත වස්තුවකින් නිකුත් වන ආලෝකයේ වැදගත් බව පහත රූපයෙන් පෙන්නුම් කෙරේ.





i. පෙනීම සඳහා අවශ්‍යය සාධක දෙක ලියන්න. (ලකුණු 02)

ii. ආලෝක කිරණයක් යනු කුමක්ද? (ලකුණු 01)


iii. ආලෝකයේ ප්‍රචාරණය පදනම් කරගෙන පහත දෑ පාරාන්ධ, පාරභාසක හා පාරදෘශ්‍ය ලෙස බෙදා දක්වන්න.

(තෙල් කඩදාසි, බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ල, පිරිසිඳු පානීය ජලය) (ලකුණු 03)

B. ආලෝකය හා සම්බන්ධ ක්‍රියාකාරකම් දෙකක ඇටවුම් දෙකක රූප සටහන් පහත දැක්වේ.




පළමු රූපය




දෙවන රූපය

i. පළමු රූපය ඇසුරින් පිළිතුරු දෙන්න.

a. මෙම ඇටවුම යොදා ගන්නේ ආලෝකයේ කවර ගුණය හඳුනා ගැනීමටද ? (ලකුණු 01)

b. නිරීක්ෂකයාට ඉටිපන්දම් දැල්ල පෙනීමට නම් කාඩ්බෝඩ් වල සිදුරු කවර ආකාරයට තිබිය යුතුද? (ලකුණු 01)

ii. දෙවන රූපයේ ඇති ඇටවුම අප යොදාගන්නේ පෙනීම හා සම්බන්ධ කවර නිගමනයක් ලබාගැනීමටද? (ලකුණු 01)

C. සතුන් කිහිප දෙනෙකුගේ ලේඛණයක් පහත දැක්වේ. බාහිර ලක්ෂණ පමනක් පදනම් කරගෙන දෙබෙදුම් සුචියකින් වර්ග කරන්න.

මයිනා, වවුලා, ගොළුබෙල්ලා, නයා (ලකුණු 02)


(මුළු ලකුණු 11)

05. A. පදාර්ථය භෞතික අවස්ථාව අනුව ඝන, ද්‍රව, වායු ලෙස වර්ග කළ හැක.

i. ඝන, ද්‍රව, වායු අවස්ථාවල ඇති ද්‍රව්‍ය කීපයක් නිරීක්ෂණය කර ඒවායේ ලක්ෂණයක් බැගින් ලියන්න. (ලකුණු 03)


| අවස්ථාව | ලක්ෂණය |
|---|---|
| ඝන | |
| ද්‍රව | |
| වායු | |

B. වායු අවස්ථාවේ එක් ලක්ෂණයක් නිරීක්ෂණය කිරීමට සිදුකළ ක්‍රියාකාකම් රූප සටයනක් පහත දැක්වේ.




i. මෙහි දැක්වෙන ක්‍රියාකාරකමෙන් පෙන්වන්නේ කුමන ලක්ෂණයද? (ලකුණු 01)

C. රූපයේ දක්වා ඇති ආකාරයට A, B බැලූන දෙකක් මීටර් කෝදුවක එල්ලා සමතුලිත කර ඇත.




i. එක් බැලූනයක් සිදුරු කළ විට කුමක් නිරීක්ෂණය කළ හැකි ද? (ලකුණු 01)

ii. මෙයින් එළැඹිය හැකි නිගමනය කුමක් ද? (ලකුණු 01)

D. A තීරයට ගැළපෙන අදහස තීරයෙන් සොයා A හා B යා කරන්න.


| A | B |
|---|---|
| a. දියමන්ති | ප්‍රත්‍යස්ථ බව |
| b. ආහන්‍යතාව | භංගුරතාව |
| c. රබර් | තඹ |
| d. අගුරු | දැඩිබව |
| e. වයනය | පුයර |

(ලකුණු 05)

06. A. පරිසරයේ අපට ලැබෙන ද්‍රව්‍ය අතරින් ප්‍රයෝජනවත් ද්‍රව්‍යයකි, ජලය.

i. මිනිසාට ජලය ප්‍රයෝජනවත් වන අවස්ථාවක් ලියන්න. (ලකුණු 01)


ii. අයිස් කැට කීපයක් දාහකයකින් රත් කරන ආකාරය රූපයෙන් පෙන්වයි.




a. ඔබේ නිරීක්ෂණයක් සඳහන් කරන්න. (ලකුණු 01)

b. මෙහිදී සිදුවන අවස්ථා විපර්යාසය ගැලීම් සටහනකින් පෙන්වන්න. (ලකුණු 01)

B. වාතයේ ජලය පවතී දැයි තීරණය කිරීමට සැකසූ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.





i. බීකරයයේ පිටත පෘෂ්ඨයේ දැකිය හැකි නිරීක්ෂණයක් දක්වන්න. (ලකුණු 01)

C. ජලය පවතින ආකාර ලෙස, වර්ෂණය මතුපිට ජලය හා භූගත ජලය ලෙස වෙන් කළ හැක. වර්ෂණයේ විවිධ ස්වරූපයෙන් ස්වාභාවික පරිසරයේදී දැකිය හැක.

i. ඒ සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 01)

D. වර්ෂණයේ එක් අවස්ථාවක් පෙන්වීමට ඔබ කළ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.




i. මෙහි A නම් කරන්න. (ලකුණු 01)

ii. B ස්ථානයේ තැන්පත් වී ඇති ජලය හඳුන්වන්නේ කෙසේ ද? (ලකුණු 01)

iii. මෙහි මතුපිට තණ පිඩලි දැමීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? (ලකුණු 01)

E. ලවණතාවය අනුව ජලය මිරිදිය, කරදිය හා කිවුල් දිය ලෙස වර්ග කළ හැක.

i. ඒවා දැකිය හැකි ස්ථාන සඳහන් කරන්න.

a. කරදිය - .....

b. කිවුල්දිය - ..... (ලකුණු 02)

ii. මතුපිට ජලය දූෂණය සිදුවිය හැකි ආකාරයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11)

07. A. එදිනෙදා ජීවිතයේදී විවිධ කාර්ය්‍ය කිරීම සඳහා ශක්තිය අවශ්‍ය වේ. ඒ සඳහා විවිධ ශක්ති ප්‍රභව යොදා ගනී.

i. ශක්තිය යනු කුමක් ද? (ලකුණු 01)

ii. ශක්තිය ලබාගන්නේ ශක්ති ප්‍රභව වලිනි. අපගේ ප්‍රධාන ශක්ති ප්‍රභවය කුමක් ද? (ලකුණු 01)

iii. ශක්ති ප්‍රභව කිහිපයක් පහත දැක්වේ. ඒවායින් ලබාගන්නා ප්‍රයෝජනය බැගින් ඉදිරියෙන් ලියන්න.

a. සුළඟ

b. න්‍යෂ්ඨික බලය


c. පොසිල ඉන්ධන (ලකුණු 03)

B. ඇතැම් ශක්ති ප්‍රභව සීඝ්‍රයෙන් අවසන් වෙමින් පවතී. එබැවින් ශක්තිය අපරිස්සමෙන් භාවිත කල යුතුය.

i. වර්ථමානයේ සීඝ්‍රයෙන් අවසන් වෙමින් පවතින ශක්ති ප්‍රභවය කුමක් ද? (ලකුණු 01)

ii. ශක්තිය අනාගත පරපුර සඳහා ඉතිරි කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

C. ජෛව ස්කන්ධ භාවිත වන අවස්ථාවක් වන කුඩු ලිපක රූප සටහනක් පහත දැක්වේ..



i. ජෛව ස්කන්ධ යනු මොනවාද? (ලකුණු 01)

ii. කුඩු ලිප සඳහා යොදාගන්නා ජෛව ස්කන්ධවලට උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## විද්‍යාව - පිළිතුරු
## Science - Answers

නම / විභාග අංකය:
Name/ Index No:

### I - කොටස

| | | | |
|---|---|---|---|
| (1) | 2 | (11) | 1 |
| (2) | 1 | (12) | 1 |
| (3) | 4 | (13) | 2 |
| (4) | 4 | (14) | 1 |
| (5) | 1 | (15) | 2 |
| (6) | 2 | (16) | 3 |
| (7) | 1 | (17) | 1 |
| (8) | 3 | (18) | 3 |
| (9) | 4 | (19) | 1 |
| (10) | 3 | (20) | 2 |

### II - කොටස

(1) A i. නිවැරදි පිළිතුරු (ලකුණු 03)
ii. a. ජීවීන්: වලිකුකුළා, පැල වෙන කජු බීජ
b. අජීවීන්: ගොළුබෙලි කවචය, පිහාටුව (ලකුණු 02)
iii. a. කුඩා දේ විශාල කර පැහැදිලිව නිරීක්ෂණය
b. නිදර්ශක එකතු කරගැනීම
c. දුරින් ඇති දෑ නිරීක්ෂණය
d. උෂ්ණත්වය බැලීම වැනි නිවැරදි පිළිතුරු (ලකුණු 04)
iv. a. නිදිකුම්බා, b. මැඩියා/ ගෙම්බා
c. කටුස්සා (ලකුණු 03)

B i. පස් (ලකුණු 01)
ii. සංයුක්ත ආලෝක අන්වීක්ෂය (ලකුණු 01)
iii. නිරීක්ෂණය: කුඩාජීවීන් නිරීක්ෂණය වීම
නිගමනය: පස්වල ක්ෂුද්‍ර ජීවීන් ඇත. (ලකුණු 02)

(2) A i. වෘද්ධි මානය (ලකුණු 01)
ii. නිරීක්ෂණය: දර්ශකය ඉහලට චලනය වී තිබීම වැනි පිළිතුරක්
නිගමනය: ශාකයේ උස වැඩිවී (වර්ධනය වී) ඇත. (ලකුණු 02)
iii. පෝෂණය, චලනය, ශ්වසනය (ලකුණු 02)

B i. සංචරනය (ලකුණු 01)
ii. වර්ධනය (ලකුණු 01)
iii. ප්‍රජනනය (ලකුණු 01)

C i. ස්වාංපෝෂීවීම/ සංචරණය නොකිරීම (ලකුණු 02)
ii. නොවිකා ගිලින (ලකුණු 01)

(3) A i. x = සාගර හා මුහුදු ජලය
y = ඝණ අවස්ථාවේ ඇති ජලය (ලකුණු 02)
ii. නිවැරදි පිළිතුරු (ලකුණු 02)
iii. වකුගඩු රෝග පිළිකා වැනි (ලකුණු 02)

B i. නිවැරදි පිළිතුරු (ලකුණු 02)
ii. a. b හා d (ලකුණු 02)
b. නිවැරදි පිළිතුරු (ලකුණු 01)

(4) A i. ඇස, ආලෝකය (ලකුණු 02)
ii. පටු ආලෝක තීරුවක් වැනි නිවැරදි පිළිතුර (ලකුණු 01)
iii. පාරභාෂක - තෙල් කඩදාසි/ පාරාන්ධ - බ්‍රිස්ටල් බෝඩ්/ පාරදෘශ්‍ය - පිරිසිදු පානීය ජලය (ලකුණු 03)

B i. a. ආලෝකය සරල රේඛීයව ගමන් කිරීම වැනි (ලකුණු 01)
b. සරල රේඛීය පිහිටීමක (ලකුණු 01)
ii. පෙනීමට ආලෝකය අවශ්‍ය බව (ලකුණු 01)
C නිවැරදි පිළිතුරු (ලකුණු 02)

(5) A i. ඝන - නිශ්චිත හැඩයක් නිශ්චිත පරිමාවක් ඇත. (ලකුණු 01)
ද්‍රව - නිශ්චිත නොවන හැඩයක් නිශ්චිත පරිමාවක් ඇත. (ලකුණු 01)
වායු - නිශ්චිත නොවන හැඩයක් නිශ්චිත නොවන පරිමාවක් ඇත. (ලකුණු 01)
B i. වායුකට නිශ්චිත පරිමාවක් නොමැති බව (ලකුණු 01)
C i. සමතුලිත බව නැතිවේ (ලකුණු 01)
ii. වාතයට ස්කන්ධයක් ඇති බව (ලකුණු 01)
D a - දැඩි බව / b - තඹ / c - ප්‍රත්‍යස්ථ බව / d - භංගුරතාව / e - පුයර (ලකුණු 05)

(6) A i. නිවැරදි පිළිතුරකට (ලකුණු 01)
ii. a. අයිස් දියවී ජලය වාෂ්ප වේ. (ලකුණු 01)
b. අයිස් ⟶ ජලය ⟶ වාෂ්ප (ලකුණු 01)
B i. ජලවාෂ්ප බැඳී ඇත (ලකුණු 01)
C i. වර්ෂාව, හිම, හිමකැට වැස්ස, අයිස් කැට වැස්ස වැනි පිළිතුරකට (ලකුණු 01)
D i. A - වැලි (ලකුණු 01)
ii. භූගත ජලය (ලකුණු 01)
iii. පාංශු බාදනය වැලැක්වීම (ලකුණු 01)
E i. a. මුහුද (ලකුණු 01)
b. කලපු (ලකුණු 01)
ii. a. නිවැරදි පිළිතුරකට (ලකුණු 01)

7. A i. කාර්යය කිරීමේ හැකියාව (ලකුණු 01)
ii. සූර්යයා (ලකුණු 01)
iii. a. නිවැරදි පිළිතුරු (ලකුණු 01) b. නිවැරදි පිළිතුරු (ලකුණු 01) c. නිවැරදි පිළිතුරු (ලකුණු 01)

B i. පොසිල ඉන්ධන (ලකුණු 01)
ii. නිවැරදි පිළිතුරු (ලකුණු 02)

C i. ඉන්ධනයක් ලෙස භාවිත කළ හැකි ශාක හා සත්ව ද්‍රව්‍යය (ලකුණු 01)
ii. දහයියා ලී කුඩු (ලකුණු 02)